# පොත්ගුල්ලි



චනුමි සෙනෝද්‍යා මඩහපොළ

# පොත්ගුල්ලි

චනුමි සෙනෝද්‍යා මඩහපොළ
**කතෘ**

**ISBN 978-624-208-706-1**

සියලු හිමිකම් ඇවිරිණි .මෙහි එන කිසිදු කොටසක්
ප්‍රකාශකයාගේ නිසි අවසරයකින් තොරව කවර ආකාරයකින්
හෝ උපුටා ගැනීම හෝ නැවත පළ කිරීම හෝ සපුරා තහනම්.

**කතෘගේ වෙනත් කෘති**


ආඩම්බරකාර සරුංගලය (ළමා කතා )
හිතුවක්කාරකමට පාඩමක් (ළමා කතා )

ප්‍රකාශිත දිනය 2025-01-08

**මහමායා බාලිකා විද්‍යාලය, මහනුවර**
**8 ශ්‍රේණිය E**

## පිදුම

බොදු කුල කතුන්,
රැජිනියන් කරන්නට
උගුර ලේ රහ වෙනකන්
කෑ ගහමින්
අකුරු ද, යහමග ද කියාදෙන,
මාගේ පන්තිභාර **දිස්නි ලක්මාලි** ගුරු මෑණියන්ට



# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි.ලක් ඉතිහාසයේ කෝට්ටේ,දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාල පරිච්ඡේද නිසාය.එසේනම් මහමායා ඉතිහාසයේද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි.දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි.පාසල තුල පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සමබන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත්විම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදී කතෘ කරදන අත්තදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුල යලි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමු කරන **"හෙරණගත්කරණි"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය හා සාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම විදුහල්පතිනිය වශයෙන් ම හට අභිමනයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි.ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමු වීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය .

විදුහල්පතිනිය,
ශෂිකලා සේනාධීර,
මහමායා බාලිකා විද්‍යාලය - මහනුවර

# 01

"ට්‍රීන්න්න්න්න්!" පස්වන කාලච්ඡේදය සඳහා සීනුව නාද වුණා.ළමයින් පේළි සැදී ගණිතාගාරය වෙත යාමට යුහුසුලු වූයේ ගණිතය මැඩම් විනාඩියක් හරි පරක්කු වුණොත් හිටගස්සවා තියෙන නිසා.

"ඉක්මනට එන්නකෝ සුසාරා"නුමන්දි සුසාරාගේ අතින් ඇන්දා.

"හ්ම් හ්ම් යං" අතේ තිබූ ගණිතය පොත් දෙකට උඩින් තබාගත් නවකතා පොතෙන් නෙත් ඉවතට නොගෙන සුසාරා කිව්වා.

පේළියට සැදුණු ළමයි පෙළ පඩිපෙළ බැහැගෙන ඉක්මන් ගමනේ යෙදුණා.

"මේ වැටෙයි වැටෙයි" මෙතුලිමා සුසාරාට කිව්වේ,ඇය පොත දිහා බලමින් ගමන් කළ නිසා.

ළමයින් ඉක්මනින් ගියත් සුසාරා නම් ගියේ පොත දිහා බලාගෙනමයි.

ඔහොම යනකොට ඇය දන්නෙම නැතුව ගුරුවරියකගේ ඇගේ හැප්පුණා.සුසාරා ගැස්සුණා.

"හ්හ්! මොකද ළමයෝ වෙලා තියෙන්නෙ,පාර බලාගෙන යන්න දන්නැද්ද?" තමන්ගේ මුහුණ ඉස්සරහ බනිමින් ඉන්න නිමන්තිකා මැඩම් දැක්කට පස්සෙ තමයි සුසාරාට මොකද්ද වුණේ කියලා තේරුණේ.

"සොරි මැඩම් " සුසාරා යටහත් පහත්ව කිව්වා.

"ගුරුවරුන්ට කිසිම ගෞරවයක් නෑ,මොකද්ද පන්තිය?"

"10 C මැඩම්"

"ආ.. දැන් කොහෙද මේ යන්නෙ අනුන්ගේ ඇගේ හැප්පි හැප්පි?"

"ගණන් වලට යනවා මැඩම්."

"හරි.මීට පස්සේ මේ වගේ වැඩ වෙන්න බෑ තේරුණාද?"

"ඔව් මැඩම්."

ඉන්පස්සේ නිමන්තිකා මැඩම් එතනින් ගියා.වටේ හිටපු ළමයි සුසාරා දිහා කන්න වගේ බලන් හිටපු නිසා ලැජ්ජාවෙන් බිම බලාගෙන සුසාරා එතනින් ටිකක් එහායින් නැවතිලා බලන් හිටපු එයාගෙ හොඳම යාලුවෝ වුණ නුමන්දියි,මෙතුලිමායි,සෙතුම්සායි ළඟට ගියා.

"ඕක තමයි කිවුවේ  ඔය කෙහෙම්මල් පොත පැත්තකින් තියලා ඉක්මනට එන්න කියලා"සෙතුම්සා මැසිවිලි නැගුවා.

"ඔයාගේ ඔය පොත් කියවිල්ල නිසා තමයි මේ හැමදේම" මෙතුලිමාත් ඊට එකතු වුණා.

"ම්ම්.මේ වටේ හිටපු ළමයි ඔක්කොම බලන් හිටියනේ,ලැජ්ජාවේ බෑ" සුසාරාගෙ මූණ ඇඹුල් කරගත්තා.

"ඒකනේ"

"හරි,හරි දැන් ඒක ඉවරයිනේ.දැන් බලන්න ගායිස් ඔයාලට පේනවද මේ ළඟපාත අපේ පන්තියේ එක ළමයෙක් හරි?"නුමන්දි කිවුවේ අනෙක් තිදෙනාගේ මුහුණු බලමින්.

"අයියෝ!ඔක්කොම කට්ටිය ගිහින්නේ.එක්කෙනෙක්වත් නෑ"සෙතුම්සා කිවුවේ වටපිට බලමින්.

"අනේ අද ඉතින් අපි ඉවරයි" සුසාරා කිවුවා.

"අනේ නුමා ඔයා කොහොමහරි මැඩම්ව ශේප් කරගන්න බලන්න හොදේ. නැත්තං අපි ඉවරයි." මෙතුලිමා කිවුවේ වේගයෙන් අඩි තිය තිය යමින්.

"ට්‍රයි එකක් දෙමු" ගණිතාගාරයට ළඟා වූ නුමන්දි කිවුවා. ගණිතාගාරයේ වසා තිබූ දොරට තට්ටු කළේ නුමන්දි.ඇතුළේ සිට පැමිණ විතුනි දොර ඇරියා.

ඇතුළේ ළමයි ඔක්කොම ඉදගෙන හිටියා.ඇතුළේ ඉදන් හිටපු ගණන් මැඩම් දැකලා හතර දෙනාම දොරෙන් එබුණා.

"ආ..කුමාරිහාමිලා.. කොහෙද මෙච්චර වෙලා ගියේ?" ගණිතය මැඩම් උපැස් යුවළ උඩින් බලමින් ඇහුවා.

"මැඩම්,වෙන මැඩම් කෙනෙක් පංතියකට පණිවිඩයක් කියන්න කිවුවා."කටකාර නුමන්දි බයාදුවෙන් කිව්වා.

"ආ..එහෙමද? ඉතින් ඔය පණිවිඩෙ කියන්න හතර දෙනෙක්ම යන්න ඕනෙද ? පණිවිඩෙ එච්චර බරයිද?"

පංතියේ ළමයි හිනාවුණා.

"කමක් නෑ.ටිකක් හිටගෙන ඉන්නවා ඔහොම."

හතර දෙනා මූණෙන් මූණ  බලාගෙන පේළියට හිටගත්තා.

"දැන් හරිනේ අමාරුව" සෙතුම්සා කිවුවේ සුසාරාට විතරක් ඇහෙන විදිහට.

"අම්මෝ මේ ජරා වැස්ස දවස් වලට නම් මං කැමතිම නෑ." මෙතුලිමා කිව්වේ වසා තිබූ ජනේලයෙන් එළිය බලමින්.

"ඔව් අනේ හරිම කම්මැලියි." නුමන්දි කිවුවේ ජර්සිය තද කරගෙන.ඒ අතර සෙතුම්සත් ඇනුමක් පිටකළා.
සුසාරා නම් හිටියේ වෙනදා වගේම පොතක් කියව කියව.

"අම්මෝ මෙයාලාගේ කම්මැලිකම."නුමන්දිගේ අම්මා  කිව්වේ හිනාවෙමින්.

සතියක පාසල් නිවාඩුවක් නිසා තිදෙනාම නුමන්දිගේ ගෙදර නවතින්න ගියා.මේ හොඳම යෙහෙළියන් සිවුදෙනා කාලෙකින් ඉස්කෝලෙන් පිටදි හමුවෙන දවසක් නිසා සිවුදෙනාම  හිටියෙ ගොඩක් සතුටින්.මොනවා වුණත් සුසාරගේ පොත් කියවිල්ල නම් වෙනදා වගේම තිබ්බා.

"මේ,මොකද කියන්නේ ෆිල්ම් එකක් බලමුද?" නුමන්දි ඇහුවා.

"අයියෝ ඉතින් මෙච්චර වෙලා ඇයි කිවුවේ නැත්තේ ඔය වගේ ඉස්තරම් අයිඩියා එකක්?"මෙතුලිමා කිව්වා.

"ඒකනේ එහෙනම් මේ වෙනකොට බාගයක්ම බලලා ඉවරයි."සෙතුත් එහෙම කියලා එකට ගුලිවුණේ සීතලට.

සුසාරා ඉතින් වෙනදා වගේම පැත්තකට වෙලා හිටියේ ගෙනාපු පොත් ගොඩෙන් පොතක් කියව කියව.තුන් දෙනාම චිත්‍රපටය බලන්න ගත්තා.ඒ අතරෙදි නුමන්දිගේ අම්මා ආවා.

"ආ මෙන්න පුතේ මං ඔයාලට කෝපි ගෙනාවා,සීතලට උණුවෙන්න බොන්නකෝ." නුමන්දිගේ අම්මා බන්දේසිය මේසය උඩින් තිබ්බා.

" තැන්ක්යූ අම්මි. මගේ හොඳ අම්මා, හොඳම වෙලාවට ගෙනාවේ." නුමන්දි පැනලා අම්මාව බදා ගත්තා.

"අනේ යන්න බොරු ආදරේ." අම්මා නුමන්දිව එහාට තල්ලු කරේ හිනාවෙමින්.

" තැන්ක් යු ආන්ටි, හරිම රසයි, මොනවද මේ?"මෙතුලිමා කෝප්පි සමග පිරිසියේ  තිබූ අමුතු කෑමක් පෙන්වමින් නුමන්දීගේ අම්මගෙන් ඇහුවා.

"මාත් නම දන්නෙ නෑ දුව.ඒත් හදන්න නම් දන්නවා ඉතින්." නුමන්දිගේ අම්මා හිනා වුණා.

"ඔව් ඔව්  ආන්ටි හදන කෑම හරිම රසයිනේ. ඒ වගේම හරිම සුවඳයි.පන්තියේදි නුමන්දි කෑම එක ඇරියාම මුළු පන්තියම සුවඳයි." සෙතුම්සා  කියපු එකට සුසාරත් එක් වුණා.

"ඒක නම් ඇත්ත."
අම්මත් නිහතමානී සිනාවක් පෑවා.

"ඔව් ඔව් අපේ අම්මි දන්නවා මේ ලෝකෙත් නැති කෑම හදන්න."

" හරි හරි දැන් කෝ සුසාරා දුව ගන්න" නුමන්දිගේ අම්මා බන්දේසිය සුසාරා වෙතට ඇල්ලුවා.

"එයාට ඉතිං පොතක් තිබ්බොත් ඇතිනේ."නුමන්දි ඇද කළා.

"එයාගේ පොත් කියවිල්ල හින්දා අපිත් සමහර වෙලාවට අමාරුවේ වැටෙනවා ආන්ටි." සෙතුම්සා කිව්වා.

"ආ... ඒ මොකද?"

"ඒවා දිග කතා නේ ආන්ටි.පස්සෙ හිමීට කියන්නම්කො."

"ඒ වුණාට පුතේ,පොත් කියවන එක නරක වැඩක් නෙවෙයිනේ. පොත් කියවීම මිනිසා සම්පූර්ණ කරනවා කියනවනේ." නුමන්දිගෙ අම්මා කිවුවේ සුසාරා දිහා බලමින්.

"ඒකනේ ආන්ටි.ආන්ටිට විතරයි තේරුනේ" සුසාරා ඒක අනුමත කළා.

නුමන්දිගේ අම්මා එතනින් යන්න ගියා. බන්දේසියේ තිබූ අමුතු කෑම ජාතියෙන් එකක් කටේ දා ගත්තේ සුසාරා අනිත් අය දිහා බැලුවා. තුන්දෙනාම සුසාරා දිහා බලාගෙන හිටියේ.

" පුදුමයි මෙයා මේවා කනවා.වෙනදා නම් ඉතින් අපි වද දෙන්න ඕනෙනේ කන්න බොන්න,හ්ම් හ්ම් බොන්න  බොන්න"නුමන්දි කිව්වා.

 සුසාරා කෝපි කෝප්පය අරගෙන බොන්න පටන් ගත්තා.

"ඒකනෙ අනේ,මං හිතන්නේ මෙයා ඔයාගෙ අම්මා හදලා දෙන කෑම වලට ආසයිද කොහෙද" මෙතුලිමා නුමන්දි දිහා බලමින් කිව්වා.

සුසාරා කියව කියව හිටපු පොතෙන් මිදිලා ජනේලෙන් එළියේ වැස්ස දිහා බලාගෙන මෙහෙම කිව්වා..

"ඔයාලා දන්නවද?මේ වැස්සයි,කෝපියි,පොතුයි අතර ලොකු සම්බන්ධතාවක් තියෙනවා."

"ඇහ් ඒ මොකද්ද?" සෙතුම්සා ඇහුවා.

"ඒක දන්නේ ඉතින් මේ මං වගෙ පොත්ගුල්ලෝ විතරයි" සුසාරා කිව්වේ ඇයගේ උපැස් යුවළ සකසමින්.

"හරි හරි පණ්ඩිතී, මේ මොනවා වුණත් මං එකක් දන්නවා දැන්."

"ඒ මොකක්ද කියමුකො බලන්න එහෙනම්." නුමන්දි කිව්වා.

"මගේ නරි මොලේට අනුව මෙයාගෙ ආසම කෑම කෝපි වෙන්න ඕන." තුන්දෙනාම හිනාවෙන්න ගත්තා.

# 03

"මේ අපි හෙට කොහේ හරි යන්ද?" මෙතුලිමා කිව්වා.

"අන්න මෙතු හොඳ අයිඩියා එක!"  නුමන්දි උඩින්ම කැමති වුණා.

"ඉතින් දැන් කොහෙද යන්නේ?" " මට නං කිව්වට අයිඩියා එකක් නෑ. කොහේ ගියත් මොනවහරි කන්න නම් ඕනෙ හොදේ"

"මොනවා කරන්නහරි කොහෙද යන්නෙ?"

"මේ අහන්නකෝ"සුසාරා කතා කළා.

" කියන්නකෝ"

" K.C.C එකේ බුක් ෆෙයා එකක් තියෙනවා ,හෙට..මේ සති දෙකම තියෙනවා." කියව කියව හිටපු පොත පැත්තකින් තියලා සුසාරා උපැස් යුවළ උඩින් අනෙක් අය දෙස බැලුවා.

"දැන් අපි එකට යන්න ඕන? එහෙමද?"නුමන්දි  අප්‍රසාදය පළ කළා.

"අනේ අනේ ප්ලීස්" සුසාරා අහිංසක පූස් පැටියෙක් වගේ නුමන්දිගේ ඇඟේ එල්ලුණා.

"මේ බලන්නකෝ නුමන්දි,වෙන කොහේ හරි යමු කිවුවොත් බෑ, පොතක් ගැව්ලා හරි තිබ්බොත් නම් ඒකට හා." සෙතුම්සා රැව්වා.

"පව් අනේ මෙයාගේ ආසාවනේ ඉතින්,එහෙනම් අපි ඇවිදලා, අයිස් ක්‍රීම් කාලා, ඒකටත් ගිහින් ගෙදර එමු." නුමන්දි කිව්වම අනික් අයත් කැමැති වුණා.

"ඉතින් ඒ  වුණාට අම්මලාගෙන් පර්මිෂන් ගන්න ඕනෙනේ." මෙතුලිමා නුමන්දි දිහා බලලා කිව්වා.

"ඒක තමයි වැඩේ තියෙන්නෙ, ඔයාලගේ අම්මගෙන් පර්මිෂන් ගන්න."සෙතුම්සා නුමන්දිට කිව්වා.

"ඒකට මම මොකක් හරි කරන්නම්කෝ."

"අනේ ඔයාලා හරිම හොඳයි" සුසාරා කිවුවේ පොඩි බබෙක් වගේ.

"අනේ පව් තොත්ත බබා."සෙතුම්සා කිවුවේ සුසාරාගෙ ඔලුව අතගාමින්.

"හොඳයි හොඳයි තමයි" නුමන්දි සුසාරව තල්ලු කළා.

"හරි එහෙනම් යංකො"

නුමන්දි ඇඳෙන් බිමට පනිනවත් සමඟම අනෙක් අයත් ඇඳෙන් බිමට බැහැලා,උඩ තට්ටුවෙන් පහළට බැහැගෙන සාලෙට ගියා. ඒ යනකොට පුටුවක් උඩ ඉඳගෙන රෙදි කැල්ලක මෝස්තරයක් අඳින නුමන්දිගේ අම්මව ඒවා දැක්කා තුන්දෙනාම නුමන්දිගේ පස්සෙන් පේළියට ගියා.

"මොකද මොකද මේ?" අම්මා හොර පූසියෝ ටිකක් දිහා බලනවා වගේ හතර දෙනා දිහා බැලුවා. නුමන්දිව අනුකරණය කරමින් අනිත් තිදෙනාම දෙ ළඟ තිබුණු සිටියේ වාඩි වුණා.

"අම්මා මොකද කරන්නේ?"

"ඔයාට මොනව කරනවා වගේ ද පේන්නේ?"

"අනේ අම්මා.."

"ආන්ටිට චිත්‍ර අඳින්නත් පුළුවන්ද?" මෙතුලිමා නුමන්දිගේ අම්මගේ අතේ තිබුණු රෙදි කැල්ලේ මෝස්තරේ දිහා බැලුවා.

"ඔව් පුතේ අපේ තාත්තටත් හොඳට පුළුවන්."

"ආ ඒක තමයි මේ ආන්ටිටත් පුළුවන් වෙලා තියෙන්නේ."

"චිත්‍ර අඳින අයට හොඳ ඉවසීමක් තියෙනවා කියලා මං අහලා තියෙනවා." සුසාරා කිව්වා.

"ඔව් ඔව් හොඳ ඉවසීමක් ඕන තමයි." මෙතුලිමාත් ඒක අනුමත කළා.නුමන්දිගේ අම්මා මද සිනහවක් පෑවා.

"ඔව් ඔව් අපේ අම්මා මෙහෙම හිටියට හරි දක්ෂයි. මෙහෙ ම සුදු බෝලේ වගේ හිටියට ඉස්කෝලෙ කාලේ වෙයිට් ලිෆ්ටින් කරලත් තියෙනව." නුමන්දි කිව්වම කවුරුත් හිනා වුණා.

"අනේ මේ බොරු කියන්නෙපා දුව"නුමන්දිගෙ අම්මා හිනා අතරින් කිව්වා.

“මේ ඒක නෙවෙයි අම්මා..”

“ම්ම් මොකක්ද.."

"මේ දැන් නිවාඩු දවස් ටිකනේ...කරන්න වැඩකුත් නෑනේ"

"ඔව්ව් ඉතින්?"

"ඉතිං හෙට K.C.C එකේ බුක්ෆෙයාර් එකක් නම් තියනවා, මේ..අපි ඒකට යන්නද?"

"එහෙනම් ඕකටද වෙච්චර වෙලා කට්ටියත් එක්ක එකතුවෙලා මාව වර්ණනා කළේ?"

"අනේ අම්මා?"

"අපි කිව්වේ ඔය ඔක්කොමද ?"

"ඔව් ඔව් නැතුව අම්මා "

"මේකයි පුතේ යනවට නම් කමක් නෑ. ඒත් ඔයාලා තනියම? වැඩිහිටියෙකුත් නැතුව?"

"අයියෝ අපි දැන් ලොකුයි අම්මා." නුමන්දි කියනකොට අම්මා හතර දෙනා දිහා වෙන වෙනම බැලුවා.

"බලමුකෝ බලමුකෝ මං තාත්තාගෙනුත් අහලා කියන්නම්, අනික මං කැමති වුණත් මේ දරුවන්ගෙ ගෙදරින් කැමතිද දන්නෑනේ?"

"අයියෝ අම්මා ඒක ප්‍රශ්නයක් කරගන්න එපා අනේ,අපි කෝල් එක කරලා කරන්නම් කෝ" නුමන්දි අම්මාගේ ෆෝන් එක අරන් තුන්දෙනත් එක්කම එයාගේ කාමරයට දිව්වා.

"අයියෝ  ඔයාලගේ අම්මා කැමති නෑ වගේ නේ,"

"ඒක තමයි."

"අයියෝ කැන්ටිමෙන් කන එක අඩු කරලා සල්ලි ඉතුරු කරගත්ත එක අපරාධයක් වෙයිද දන්නෑ"
සුසාරා කිවුවේ තම  අම්මාගේ දුරකථන අංකය ඔබමින්.

"ඔව් ඔව් ඔයා පොත්ගන්න පෙරුම් පිරුවනේ."

තිදෙනාම තම ගෙවල්වලට ඇමතුම් ගත්තා.සුසාරාගේ හා මෙතුලිමාගේ දෙමව්පියන් කැමැත්ත දුන්නත් සෙතුම්සාගේ දෙමාපියන්ගේ දුරකථන අංකය වැඩ කළේ නම් නැහැ.

"අපි නම් හරි,සෙතූගෙ තමයි ප්‍රශ්නේ."

" පස්සේ අරගෙන බලමුකෝ, අපේ අම්මා නැති වුණත් තාත්තා කැමති වෙයි." සෙතුම්සා පැහැදිලි කළා.

"අනේ එහෙම වුණොත් නම් හොඳයි." සුසාරා කිව්වා.

*  *  *  *  *  *  *

රෑ කෑමෙන් පස්සෙ හතරදෙනාම නිදියන්න ආවා.
"මේ එහෙනම් හෙට යන්න බලාගෙන ඉන්න.." නුමන්දි කිව්වා.

"ඔව් ඔව්,ඕන දේවල් ඔක්කොම ලෑස්ති කරගන්න" මෙතුලිමා කිව්වා.

" මට හරිම සතුටුයි" ඒ සුසාරා.

"මටත් සතුටුයි අපේ අම්මා පහුවෙලා හරි කැමති වුණ එකට." සෙතුමිසා එහෙම කියද්දී අනෙක් අය මුහුණෙන් මුහුණ බලාගත්තා.

## 04

"මේ සුසාරා,මේ සැරේ ක්ලාස් එකේ පළවෙනියා ඔයාලු!"
මෙතුලිමා ,නුමන්දි ,සෙතුමිසා  පන්තියේ මුල්ලකට වෙලා නවකතා පොතක් දිග ඇරගෙන ඒක දිහා ගිලින්න වගේ බලන් හිටපු සුසාරව වට කරගෙන කිව්වා. ඒත් ඒක එයාට ඇහෙන්නැති පාටයි.

"මේ!ඔයාලු මේ සැරේ ක්ලාස් එකේ පළවෙනියා!" නුමන්දි ඇයගේ උරහිසෙන් අල්ලලා හෙලෙව්වා.

"ඇයි ඇයි?" ඒ වුණත් ඇය ඔවුන් දිහා බලනවා වෙනුවට පොතෙන් මිදීමට බැරිව හිටියා.

"තමුන් කන් ඇහෙන්නැද්ද මනුස්සයෝ?"

"ඇයි මොකද්ද?"

" ඇයි? දැන්වත් ඔය පොත පැත්තකට දානවකො" සෙතුමිසා ඇයගෙන් පොත උදුරලා පැත්තකට දැම්මා.

"ආ කියන්නකො මොකද්ද ඔය ලොකු කතාව?"සුසාරා ඔවුන්ගේ පැත්තට හැරුණා.

"ඔයා තමයි මේ සැරේ පන්තියේ එක " නුමන්දි තුන්වෙනි වතාවටත් කිව්වා.

"නෑ?"

"නෑ නෙවෙයි ඔව් ! හැබැයි පුතෝ මේ සැරේ නම් පරිස්සමෙන් හොදේ"

"ඇයි?"

"ඇයි? ඇයි තමා අර මෝඩ අදැහැමියා ඉන්නේ, අන්න එයා ඔයාට මොකක්හරි සෙල්ලමක් දානවාමයි."

"ඔව් ඔව් ඒකනම් මට සීයට දාහක්ම ශුවර්" මෙතුලිමා අත් දෙක බැඳගෙන කිව්වා.

"ඒ මොකද?"

"ඇයි අනේ ඔයා මේ ලෝකේ නෙවෙයිද ඉන්නේ? හැම වාරෙකම පළවෙනියා වෙන ළමයට එයා මොකක්ම හරි වදයක් දෙනවනේ. ගියවාරෙ නුලත්මගෙ අච්චු පොත් නැති කරලා, ඊට කලින් සැරේ විහගිගේ කෑම එකට මොනාදෝ දාලා එයාට වමනෙ ගියා.ඇයි නවයේදී පිරියට කට් කරලා මෙතුව අහු කළේ? ආයෙ මට මතක හැටියට තව ළමයෙක්ගෙ මොකක්දෝ බඩුවක් කැඩුවා." නුමන්දි කියවගෙන කියවගෙන ගියා.

"ආ ඒකද මේ? ඒක මං බලාගන්නම්කෝ"

" බලාගන්න? හ්හ්! කෝකටත් ඔයා කන බොන දේවල් ගැන පරිස්සමෙන් හොඳේ,ආය තමන්ගේ බඩු ගැනත් අවදානයෙන් ඉන්න දැනමුතුකමින් කිව්වා.

"හරි හරි මට ඉන්නවනෙ ඉතින් චණ්ඩි මිතුරු කැලක්,බයවෙන්නෙ මොකටද?"සුසාරා කිව්වා.

"ආ අන්න එහෙම එන්න" නුමන්දි කිවුවා.

"මේ දැන් ඔයාලා කොහොමද දන්නේ මං පළවෙනියාමයි කියලා?"

" වෙන කාගෙන්ද ඉතින් අපේ මැඩම්ගෙන් ඇරෙන්න?"

"ආ එහෙනම් හරි.එතකොට ඔයාලා?"

"ම්ම්,මං 5,මෙතූ 3,සෙතුත් 5 අපි දෙන්නගෙම ලකුණු එක සමානයි."නුමන්දි කිවුවේ සෙතුම්සව පෙන්වමින්.

"අපි ඔක්කොම හොදයි මේ සැරේ"

"මේ ඒක නෙවෙයි,අපි සතුට සමරන්නත් එක්ක යන්ද කැන්ටීන්?"මෙතුලිමා යන්න ලැස්ති වුණා.

"යං යං දැන් පොත් අරගෙනත් ඉවරනේ ඒ නිසා මටත් හොදට කන්න පුලුවන්"

"මං හිතුවෙ ඒක ඊළඟ සැරේ පොත් ගන්න තියාගනී කියලා." සෙතුම්සා කිව්වේ මද සිනාවකින්.
හතර දෙනාම යන්න පිටත් වුණා.

" මේ ඒක නෙවෙයි සුසාරා මට දැන් මතක් වුණේ ඔයා තනියම කොහෙවත් යන්න එපා හොඳේ, අර අදැහැමියා මොකක්හරි එකක ඇතුලේ තනියම හිටියොත් එළියෙන් දොරවත් ලොක් කරලා දායි"සෙතුම්සා අනතුරු ඇඟෙව්වා.

"අයියෝ බයවෙන්න එපා දෙයියන්නේ ඔය ළමයෙක්ට" සුසාරා ගණන් නොගෙන කිව්වා.

"ඔන්න මං ගානෙ අද ඔක්කොටම අයිස් ක්‍රීම්"නුමන්දි ආපනශාලාව ළඟට ආවාම කිව්වා.

"අනේ හොද නුමන්දි "

## 05

සුසාරා අනෙක් තිදෙනාගෙන් මිදිලා පන්තියට යන්න පිටත් වුණේ ඇයට පුස්තකාල පොතක් කියවා ඉවර කර ගැනීමට තිබූ නිසා. නුමන්දි අරන් දුන්න අයිස්ක්‍රීම් එකත් කකා සුසාරා පන්තියට ආවවෙලාවේ කවුරුත් පන්තියේ හිටියේ නම් නැහැ. තමන්ගේ ඩෙස්ක් එක ළඟට ගිහින් ඇය බෑගයේ තිබූ නවකතා ගොඩෙන් පුස්තකාල පොත අරගෙන පුටුවෙන් වාඩිවෙලා කියවන්න ගත්තා.

ටික වේලාවකින් දැහැමි එයාගේ යාළුවො දෙන්නයි පන්තියට ආවත් සුසාරා දැක්කෙ නෑ වගේ පොත දිහා බලාගෙන එහෙම්මම හිටියා. ඇය හිතාගෙන හිටපු විදිහටම ඒ තුන්දෙනා සුසාරා හිටපු තැනට ආවා.සුසාරා පොත දිහා බලාගෙන හිටියත් ඇයගේ හිත තිබුණේ ඊළඟට මෙතන මොකක් වෙයිද කියලා.නුමන්දි කිව්ව දේ නම් හරියටම හරි.

"මේ ඉන්නෙ මහ ලොකු වැඩ්ඩා" දැහැමි උපහාසයට වගේ හිනා වෙලා කිව්වා. සුසාරා ඇහුනෙ නෑ වගේ හිටියා.

"ඒයි! තමුන්ගෙ කන් ඇහෙන්නැද්ද ආ?"දැහැමිගේ යාලුවො දෙන්නගෙන් එක්කෙනෙක් කිව්වා.

"හිතන් ඉන්නෙ මේ පාර දින්නා කියලද මම්?"

"දැහැමි,ඔයා මේ මොකක් ගැනද කියන්නෙ?"

"අනේ දන්නෑ බබා? මං මේ කියන්නේ තමුන්ගෙ මහ ලොකු පළවෙනියා වුණ ගැන?"

" දැහැමි මං පාඩම් කරලා තමයි පළවෙනියා වුණේ. අනික තාම හරියටම දන්නෙත් නැනේ මං පළවෙනියාමද කියලා. ඔයත් හොඳට පාඩම් කරලා ඊළඟ සැරේ පළවෙනියා වෙන්න."

"අනේ මේ මට තමුන්ගේ ඇඩ්වයිස් ඕනෙ නෑ,බලාගන්නවකෝ තමුන්ට මොකද වෙන්නෙ කියලා."දැහැමි අත් දෙක බැඳගෙන කිව්වා.

"මොනවා බලන්නද?"

"මේ මේ තමුන්ගේ කට වැඩියි හරී?"

"නෑ නෑ දැහැමී මෙයාගෙ මේ කට එහෙම්මම වැහිලා යයි ඉස්සරහට" දැහැමිගේ යාලුවෙක් කිව්වා.

තුන්දෙනාම උපහාසාත්මකව හිනාවෙමින් එතනින් යන්න ගියා. සුසාරා ඒක අමතක කරලා පොත දිහා බලනවත් සමගම නිවේදනයක් ඇසුණා.

"දහයේ ශ්‍රේණියේ ශිෂ්‍යාවන් ප්‍රශංසනීය ප්‍රගති වාර්තා ලබාදීමට ප්‍රධාන  ශාලාවට පැමිණෙන්න."

සුසාරා පොත බෑග් එක ඇතුලට දාලා එතනින් යන්න නැගිට්ටා.තුන්දෙනාම පන්තියේ හිටපු නිසා එයාලාට නැතුව ඇති කියලා සුසාරා හිතුවා.

06

ප්‍රගති වාර්තා ලබාදීමෙන් පසු ශිෂ්‍යාවන් පන්තිවලට පියමං කළේ කොක් රෑනක් වගේ.

"අම්මෝ! දැන්නම් හොදටම දාඩියයි"නුමන්දි අතින් පවන් ගහමින් කිව්වා.

"දැන් ඉතින් ඊළඟ පීරියඩ් එකේ ඉඳන් උගන්නයිද දන්නෑ!"ඒ සෙතුම්සා .

"ඊට පස්සෙ ලයිබ්‍රරි" සුසාරා කිව්වා.

"ඔව් අප්පා!අද වත් නිදහසේ ඉන්න තිබ්බ එකනේ!"මෙතුලිමා කම්මැළිකම පෙන්නුවා.

"හ්මම්, කියලා වැඩක් නෑ."

"ආ මේ! ඔයාලා කිව්වා හරියටම හරිනෙ, කිව්වා වගේම මං පන්තියේ ඉන්නකොට දැහමියි,එයාගේ යාලුවොයි මං ළඟට ඇවිත් තර්ජනය කරානේ."

"මං කිව්වේ මං කිව්වේ හූනා කිව්වා වගේ කොයි වෙලාවේ මොනවා වෙයිද දන්නෑ." එහෙම කියලා නුමන්දි වටපිට බැලුවා.

"ඉතින් ඔයා මොනවද කිව්වේ?" මෙතුලිමා ඇහුවේ නුමන්දිට වත් කතා කරන්න ඉඩ නොතබා නොඉවසිල්ලෙන්.

"මං මුලින් මොනවත් දැක්කෙ නෑ දන්නේ නෑ වගේ ඉඳලා පස්සේ කියන්න ඕනෙ ටික කිව්වා."

"ඊටපස්සේ?"

"ඊටපස්සේ දැහැමියාගේ යාලුවෙක් කිව්වානේ ඉස්සරහට මෙයාගේ කට වැහෙයි කියලා."

"හරි.එහෙනම් ඔය කියවන්නේ මොකක්හරි කරන්න බලන් තමයි"

"හ්මම්"

"ඔව් ඇ,ඔයා පරිස්සමෙන් ඉන්න හොඳේ."

* * * * * * * *

සිව්දෙනාම පන්තියට ගියා. ඊළඟ කාලච්ඡේදය ඉගැන්වීමෙන් අනතුරුව පුස්තකාල කාලච්ඡේදය සඳහා යාමට ශිෂ්‍යාවන් සූදානම් වුණා.

"මෙතුලිමා මගේ ලයිබ්‍රි පොත දැක්කද?" සුසාරා ඇහුවේ බඩු එහා මෙහා කරමින්.

"මං කොහෙ දකින්නද? ඇහි පිල්ලං ගහන්නවත් වෙලාවක් තිබ්බයෑ,උගන්නනවා උගන්නනවා ඉවරයක් නෑනෙ"

"මේ විහිලු නෙවේ,ඇත්තටම ඇත්තටම ඔයාලාවත් දැක්කේ නැද්ද ?" සුසාරා ඇහුවේ අනෙක් දෙදෙනාගෙන්.

"නෑ අනේ ඔයා කියව කියව හිටියා නේද?" සෙතුම්සා ඇහුවේ පොත් අස් කරමින්.

"ඔව් අනේ මං බෑග් එකට දාලානේ ගියේ.අයියෝ මගේ අනිත් පොතුත් නෑනේ?"

"ඈ! විහිලු නෙවෙයි නේද?"

"අයියෝ දෙයියනේ නෑ අනේ මේක විහිලු කරන වෙලාවක් නෙවේ!"

"ඒ ඔක්කොම නවල්ස් නැද්ද ?"

"අනේ නෑනේ නුමන්දී! ඔයලාගේ බෑග්ස් වලත් නැද්ද?"

"ම්ම්ම් මගේ එකේ නම් නෑ"

"අපෙ ඒවගෙත් නෑනේ!"

"අයියෝ කොහෙද දෙයියනේ!මගේ හොඳම පොත් ටික!"සුසාරා මූණ ඇඹුල් කරගෙන කිව්වා.

"බෑග් එකේ හොදට බලන්නකෝ"

සුසාරා බෑගයේ සියලු සිප් ඇර බැලුවත් හම්බුනේ නම් නැහැ.

"අනේ නෑ නුමන්දි! මං මොකද කරන්නෙ? දන්නවනේ ලයිබ්‍රි මැඩම්ගේ හැටි.වැඩේ කියන්නේ මගේ අනිත් පොතුත් නෑනෙ" සුසාරාට ඇඩෙන්න ඔන්න මෙන්න වගේ.

"මේ අනිත් අයගේ මේසවලත් නෑ" සෙතුමිසා බැලුවා.

ඒ අතරේ පන්ති නායිකාව රුවින්දි කතා කළා.

"හැමෝම පේළියට පෝලිමක් හැදෙන්න.එක්කෙනෙක්වත් පන්තියේ යන්නෙ නැතුව ඉන්න එපා.එහෙම වුණොත් මං මැඩම්ට කියනවා."

"අයියෝ දැන් හරිනේ!පන්තියෙ ඉන්නත් බෑ.මැඩම් හොඳටම බනී,මුලු පන්තියම ඉස්සරහ"සුසරාට කඳුලු ආවා.

"අඬන්න එපා සූ,මැඩම්ට මොකක් හරි බොරුවක් කියමු"

"මැඩම්ට බොරුවක් කිව්වත් මගේ අනිත් පොත්?" සුසාරා කිව්වේ අඬමින්.

"හරි හරි අපි මොකක් හරි කරමූකො." සෙතුමිසා සුසාරාව සැනසුවා.

"අනේ කොහෙද දෙයියනේ මගේ අලුත්ම පොත්? බෑග් එකේ තිබ්බ එකනේ?"සුසාරා තවත් ඇඩුවා.

"සූ, දැන් අඬන්නැතුව ඉන්නකො අපි ඉක්මනට හොයාගමු"

සියල්ලෝම පුස්තකාලය වෙත ළගාවුණා.ඇතුලේ පුස්තකාල ගුරුතුමිය ඉන්නවා දැකපු සුසාරා කඳුළු පිහදගත්තා.සියල්ලෝම ඇතුලට ගියේ චකිතයෙන්.

## 07

"අයියෝ සුසාරාට මැඩම් හොදටම බැන්නනේ,මැඩම්ට තේරුනාද කොහෙදෝ පොත නැතිවෙලා කියලා"

"ඒකනේ එයාට දිවැස් තියෙනවද කොහෙදො"සෙතුම්සා කිව්වා.

"පොතක් ගෙනත් දෙන්න නම් පුලුවන්.ඒත් මගේ නවල්ස් ටික?"

"අනේමන්දා සුසාරා"

"පච් ඔයා මැඩමුත් බනිනකොට ඔයාට හොදටම ඇඩුනනේ!"

"මං දන්නෑ මෙතූ පොත් නැතිවුණා කියන්නෙ,මට මොනවා වෙයිද දන්නෑ"

"ඔව්, ඔයාගේ ජීවිතේම පොත්නේ" සෙතුම්සා කිව්වා.
සියල්ලෝම පුස්තකාල කාලච්ඡේදය නිමා වී පන්තියට යමිනුයි හිටියේ.එහෙම යන අතරමගදී නුමන්දි දැකපු දෙයින්…

"ඒ අර බලන්නකො අර..කුණු ගොඩේ.."නුමන්දි පෙන්නුවා.

"මොකද්ද?"

"එන්නකො එන්නකො" නුමන්දි එතන ළඟට ගියා
.
"ස්ස්ස්ස් අනේ දෙවියනේ සුසාරා!"
ඒ කුණු ගොඩ දැකලා හැමෝම දුක් වුණා.එතන තිබ්බේ බාගෙට පිච්චිලා තිබුණු පොත් ටිකක්!

"හ්හ්හ්හ්හ්හ්!!
අනේ මේ මගෙ පොත් ටිකනේ…!"සුසාරා එතන බිම දණගහගෙන බාගෙට පිච්චුණු පොත් කැලි අරගෙන හොඳටම අඩන්න ගත්තා.

"කවුද මේ වගේ ජරා වැඩක් කරේ? ලයිබ්‍රි පොතත් ඕතන පුච්චලා නේද?"නුමන්දි කිව්වා.

"අයියෝ අලුත්ම පොත් ටිකනේ!"

"කවුද මේ වගේ ජරා වැඩක් කරන්නේ?"සෙතුම්සා ඇහුවා.

"මේ මං නම් කියන්නේ ඕක අර අදැමියාගේ වැඩක්"නුමන්දි කිව්වා.

"කොහොමද හරියටම එහෙම කියන්නෙ?"

"එයා නැතුව ඉතින්,වෙන කවුද මේ වගේ කැත වැඩක් කරන්නේ?"

"මොකද දැන් කරන්නේ මේකට?ෂික්!පොත් එක්කම හිටපු කෙනෙක්ට කොහොම දැනෙනවා ඇතිද?"

"අනේ මන්ද සෙතූ,ලයිබ්‍රි පොත නම් ගෙනත් දෙන්න වුණත් පුලුවන්නෙ,හැබැයි අරයා මෙහෙම කලා කියල ඔප්පු කරන්න විදිහකුත් නැනේ.මේවා දැක්කා කියලා මැඩම් නම් කීයටවත් පිළිගන්නේ නෑ."

"දැන් ඉතින් අඩලා වැඩක් නැනේ සුසාරා,අපි යමු පන්තියට" ඒත් සුසාරා නම් එන පාටක් නෑ.

"යං කො ගිහින් මං අර ජරා අදැහැමියාට හොඳට දෙකක් කියන්න." නුමන්දි කිව්වා.

"යංකො ඔය නපුරිට හොඳ පාඩමක් උගන්නන්න."සෙතුම්සා සුසාරාව ඇදගෙන පංතියට යන්න අඩිය තිබ්බා.

"වැඩක් නෑ,එයත් එක්ක කියෙව්වා කියලා ආයේ පොත් හම්බෙන්නෙ නැනේ.අනික වෙන කෙනෙක්ද දන්නැනෙ"සුසාරා අඩමින් කිව්වා.

"නෑ නෑ එයා තමයි මේක කරේ ෂුවර්"

"සුසාරා ඔයා කඳුලු පිහදගන්නකො,එයාට පේන්න හොදනෑ අපි එයාට සෙකන්ඩ් වෙනවා කියලා"

"ඕන නෑ අනේ මට පොත් ආපහු හම්බෙනවනම් කමක් නෑ අනික ලයිබ්‍රි පොතටත් ඔප්පු කරන්න සාක්ෂි නෑනේ"

"කමක් නෑ යමු යමු"

එයාලා පන්තියට යනකොට දැහැමිලා හිටියේ නැහැ. ටිකක් වෙලා යනකොට එයාලා පන්තියට ආවා.නුමන්දි එයාලා ළඟට ගියා.ඒ නුමන්දි පස්සෙන් අනිත් තුන්දෙනත් ගියා.

"ආ කුමාරිහාමිලා,මොකද මොකද මේ?" දැහැමි ඇහුවේ මුකුත් නොදන්න ගාණට.

" මොකක්ද මේ කරලා තියෙන ජරා වැඩේ ආ?"නුමන්දි ඇහුවා.

"මොන ජරා වැඩක්ද ?"දැහැමි කිව්වා.

"අනේ මේ බොරු තොත්ත බබා වෙන්න එපා හරිද?"

"කවුද තොත්ත බබා ආ?"

"මේ සුසාරාගේ පොත් ටික පුච්චලා ජේන්ඩම කුණු ගොඩේ දාලා මොකද්ද ඔයා බලාපොරොත්තු වෙන්නේ?"

"මේ ඔය කෙහෙම්මල් පොතක් පිච්චුවෙ නෑ අපි හරිද?"

"අනේ පව්.දැන් සතුටු ඇති නේද? හිතන් ඇති මහ ලොකු වැඩක් කරා කියලා"

"මේ මේ බොරු චෝදනා කරන්න එපා"

"මොකක්ද දැහැමි මේ කරන වැඩේ තේරුම? දන්නවද තමුන් පොතක් කියන්නෙ කොච්චර වටින දෙයක්ද කියල?තමුන්ට ඔහොම කරල මොළේ කළදක් නැති වෙයි." නුමන්දි කියවගෙන යනකොට මෙතුලිමත් එකතු වුණා.

"පව් වැඩ ඕවා හරිද පව් වැඩ" මෙතුලිමා කිව්වා.

"මේ මේ අපිට පිං පව් කියල දෙන්න ඕනෙ නෑ ඔයා.දැන් කුමාරිහාමිට සැප ඇති නේ?" දැහැමි සුසාරා දිහා බලන් කිව්වා.

"ආ ඔය කියවෙන්නෙ? බලගන්නවා අපි මේක අනිවාර්යයෙන්ම මැඩම්ට කම්ප්ලේන් කරනවා."නුමන්දි කිව්වේ ස්ථිරසාර හඬකින්.

ඊට පස්සේ හතරදෙනාම එතනින් යන්න හැරුණා. මුළු පන්තියම එයාල දිහා බලන් හිටියෙ කන්න වගේ.

"කියනවා ඉතින් කියනවා."දැහැමි කිව්වා.

"කියනවා තමයි !"නුමන්දි ගස්සගෙන යන්කොට අනිත් අයත් ගියේ මැඩම්ව හොයන්.

"මේ ස්ටාෆ් රූම් එකේ බලමුකෝ"සෙතුම්සා කිව්වා.

හතර දෙනාම පන්තිභාර ගුරුතුමියට ම විස්තරේ කිව්වා.
දැහැමි සහ ඇයගේ යාළුවන් දෙදෙනාට නිසි දඬුවම් ලැබුණත් සුසාරාගේ පොත් නම් ආයේ හම්බුනේ නැහැ.

08

"මේ ඔයා එයාව එක්කන් එන්න අපි වැඩේ බලගන්නම්."මෙතුලිමා කිව්වේ නුමන්දිට.

"හරි හරි එහෙනම් මං එනකොට බොරුවට හැව්මක් අරිනවා හොදේ." නුමන්දි කිව්වා.

"හරි හරි දැන් යන්න.ගිහින් මොනවහරි කියව කියව ඉන්න"

"එහෙනම් එනකොට ඔක්කොම රෙඩි කරල තියන්න.."නුමන්දි තහවුරු කළා.

"ඒක ප්‍රශ්නයක් කරගන්න එපා"

"ඔන්න මං යනවා එහෙනම්...බායි"

නුමන්දි එතනින් ගියා.සුසාරාගේ උපන්දිනය නිසා ඔක්කොම යාලුවෝ එකතුවෙලා හොරෙන්ම මෙතුලිමාගේ ගෙදර එළිමහනේ උපන්දින සාදයක් සූදානම් කළා.මේ මුකුත් නොදන්න සුසාරා නම් හිටියේ ඇවිද ඇවිද කල්පනා කරමින්.ඇයගේ පොත් නැතිවීමේ දුක තාම ගිහින් තිබුණෙ නෑ.

"සූ,ඔයා මොකද කරන්නේ මං හැමතැනම හෙව්වා."නුමන්දි ගහක් ළඟ වටේ කැරකි කැරකි හිටපු සුසාරාට බොරුවට කිව්වා.

"මුකුත් නෑ නුමන්දි,කෝ අනිත් අය?"

"එයාලා කොහෙ හරි යන්න ඇති,මං හිතන්නේ වොශ්රූම්"

"හ්ම්ම් මේ ඇයි අද අපි මෙහෙ ආවෙ?"

"නිකම් ඉතින් වෙනසකටත් එක්ක"

"හ්ම්ම්.මට ඉතින් වෙන කරන්න වැඩකුත් නැනෙ,පොත් කියවනවා ඇරෙන්න"සුසාරා කිව්වේ දුකින්.

"අයියෝ ඕක අමතක කරන්න සුසාරා"

"ඔයා නම් කියයි,මං නේ දන්නේ ඒකේ අගේ"

"ඒක මං දන්නවා සූ,අනික මේ ලෝකෙ අපිට ජීවත් වෙන්න තියෙන්නෙ අභියෝග,බාධක මැද.ඒක තමයි මේ ලෝකෙ හැටි"

"අම්මෝ නුමන්දි ඔයාගේ බහුශ්‍රැතකම වැඩිවෙලානේ"සුසාරා කිව්වේ මද සිනාවකින්.

"අන්න එහෙම හිනාවෙලා ඉන්නකො අප්පා,ඔයා ඔහොම ඉන්නකොට අපිටත් එපා වෙනවනේ"

"ඒකනේ මං නැති වුණොත් තේරෙයි මගෙ අගේ"

"ඒකනෙ ඒකනේ කියන්නේ"නුමන්දි කිව්වා.

"මේ ඒක නෙවෙයි අපි යන්ද අර පැත්තට?"

"මොකද මොකද හදිස්සිය?"

"ඇයි?මෙහෙම හිටියා කියලා වැඩක් නෑ නුමන්දි අපි යං" සුසාරා යන්න හැරුණා.

"ඒක තේරුම් ගත්තනම් හොදයි.අනිත් එක හොද මිනිස්සුන්ට කොහොමත් හරියනවා.ඒ වගේ ඔයාටත් කොහොමහරි පොත් ලැබෙයි ආයේ"නුමන්දි යනගමන් කිව්වා.

"ලැබෙයි ලැබෙයි ආයෙ" සුසාරා කිව්වේ ස්ථිරවම.දෙදෙනාම නිවස දෙසට පියමන් කළා.

"හා...ච්ච්චිං‍ං‍ං" නුමන්දි බොරු කැස්ස ක්‍රියාත්මක කළා.
හැමෝම සූදානම් වුණා.

"නුමන්දි කොහෙද යන්නේ මේ ?" සුසාරා එහෙම ඇහුවේ නුමන්දි ඇයව එක්කගෙන වෙනදා නොයන පැත්තකින් යන නිසා.

"යං යං එන්නකෝ පොඩ්ඩක් ඇවිදලා යමු ගේ ඇතුලට"නුමන්දි කිව්වා.

"හා හා යමුකො"

නුමන් දිගේ හැවමත් එක්ක හැංගිලා හිටපු කට්ටිය සූදානම් වුණා. නුමන්දි සුසාරයි එතෙන්න ඉක්මනටම ළඟා වුණා.

"සප්‍රා....යිස්!!"
එතන හිටියේ සුසාරාගේ යාළුවෝ හතරදෙනයි එයාලගෙ දෙමාපියෝයි තව පන්තියේ ළමයි කීපදෙනෙකුයි.එතන තිබුණු මේසෙ කේක් එක සහ තව කෑම වර්ග වලින් පුරවලයි තිබුණේ.

"අනේ !!"

"හැපි බර්ත්ඩේ සූසාරා !"හැමෝම යාලුවෝ එකසැරේ කිව්වා.

"තැන්ක් යූ මගේ මිතුරියනේ! මං දැනගෙන හිටියේ නෑනේ ඔයාලා මෙහෙම කරනවා කියලා."

"හැපි බර්ත්ඩේ මගේ පුතේ!"සුසාරාගෙ අම්මා සහ තාත්තා ඇයව බදාගත්තා.

සියලු දෙනාගේ සුබ පැතීමෙන් අනතුරුව කේක් කැපුවාට එළඹියේ...

"සුසාරා දැන් කේක් කපලා කවලා පොවලා ඉවරයිනේ,දැන් තියෙන්නේ තෑගි දෙන්න.."සෙතුම්සා සහ මෙතුලිමා කිව්වා.

"ඔන්න මගෙන්" සුසාරාගේ හොදම යාලුවා වුණ නුමන්දි  පළමුවෙන්ම දුන්නා.

ඉන්පසු අනෙක් අයත් සුසාරාට තෑගි ලබා දුන්නා.

"තැන්ක් යූ"

"මේ තැන්ක් යූ තැන්ක් යූ නෙවෙයි දැන් ඕවා ඇරලා බලන්නකො මොනවද තියෙන්නේ කියලා."නුමන්දි කිව්වා.

"එහෙම හොඳද?" සුසාරා ඇහුවා.

"බලන්න බලන්න ආය කමක් නෑ"මෙතුලිමා කිව්වා.

සුසාරා ඇයට ලැබුණු තෑගි එකින් එක විවෘත කරන්නට වුණා. එසේ විවෘත වන එක් එක් තෑගි දුටු විට ඉහේ මලක් පිපුණා  වගේ ඉතා සතුටක් ඇතිවුණේ.

"අනේ ඔයාලා හැමෝම මට පොත් දීලානෙ!"

"මගෙ නැතිවුණ පොත් ආයේ හම්බුණා වගේ දැනෙන්නේ!"

"ඔයාලා ඔක්කොටම ගොඩා....ක් තැන්ක් යූ"

"අනේ තැන්ක් යූ ගොඩා...ක්"

"ඔයාලා මගේ හොඳම හොඳම හොඳ....යාලුවෝ!"සුසාරා යාලුවන්ව බදාගත්තා.

"මේ! ඔහොම්මම ෆොටෝ එකකුත් ගහන්නකො" නුමන්දි කිව්වා.

"චීස්"

-නිමි -

## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වනවිට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යකි. එම බිජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි.පාසලක් මුල් වීමෙන්  අධ්‍යාපානයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප,පළාත්,ජතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සදහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි.මෙහිදී මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය,දියණියන්,ගුරුභවතුන්,දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි.පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින් ලබා දිය නොහැකිය.මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුල විවිධ ගැටළු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි.මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්වී විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩ නගා දී තිබේ.තම නිසග,සාහිත්‍ය නිර්මාණ හැකියාව තුලින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංශන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධිකාරක,
සෙනවිරත්න මහලේකම්

ISBN 978-624-208-706-1